**18 වන ව්‍යවස්ථාව අහෝසි වී 17 වන සංශෝධනය බලාත්මක වන බවට වූ මූලික උපකල්පනය මත පිහිටා 17 වන සංශෝධනයට ඇතුලත් නොවූ කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් මෙම යෝජනා ඉදිරිපත් කරමු**

**විශේෂ කරුණු**

**පාර්ලිමේන්තුවට පමණක් වගකියන බව**

1 මැතිවරණ කොමිසම පාර්ලිමේන්තුවට පමණක් වග කියන ආයතනයක් වන අතර ඔවුන්ගේ තීන්දු ශ්‍රේෂ්ඨාධිකරණය හැර වෙනත් කිසිදු තැනක අභියෝග නොකළ යුතුයි

**මැතිවරණ කොමිසම දෛනික පරිපාලන කටයුතුවලට මැදිහත් නොවිය යුතු බව**

2 මැතිවරණ කොමිසම දෙපාර්තමේන්තුවේ දෛනික පරිපාලන කටයුතු සඳහා මැදිහත් නොවිය යුතු අතර එය කොමසාරිස් ජනරාල් වරයාගේ අධීක්ෂණය යටතේ විය යුතු අතර ප්‍රතිපත්තිමය කරුණු කෙරෙහි පමණක් කොමිසන් සභාව අවධානය යොමුකළ යුතුයි එසේ වුවත් මැතිවරණයක් ප්‍රකාශයට පත්කළ පසු එම මැතිවරණය සාධාරණව පැවැත්වීම සඳහා කොමිසම සියළු උත්සාහයන් දැරිය යුතුයි

**පළමු මාස 6 ඇතුලත ගැටළු හඳුනා ගැනීම කළ යුතු බව**

3 මැතිවරණ කොමිසන් සභාව පළමු වරට පත්වී පළමු මාස 6 තුළ සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට ඇති සියළු බාධා හඳුනාගෙන ඒවා වළක්වා ගැනීමට ගතහැකි සියළු පියවරයන් ගත යුතුයි එහිදී මැතිවරණය ප්‍රකාශයට පත්වීමට පූර්වගාමීව සහ පශ්චාත් කාලය පිළිබඳව ද විශේෂ අවධානයක් යොමු කළ යුතුයි

**සෑම මැතිවරණයක් අවසානයේම ගැටළු හඳුනා ගැනීම**

4 සෑම මැතිවරණයක් අවසානයේම මාස තුනක් ඇතුලත එකී මැතිවරණ ආශ්‍රිතව මතු වූ ගැටළු හඳුනාගෙන වාර්තා කළ යුතු අතර ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි

**ඡන්ද දායකයන්ට පහසුකම්**

5 ඡන්දය දිනයේදී කිසියම් හේතුවක් නිසා ඡන්ද පොළට ගොස් ඡන්දය භාවිත කිරීමට අපහසු ඡන්ද දායකයන්ට ඡන්දය භාවිත කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම කොමිසමේ වගකීමක් වන්නේයි

**අනු නීති සම්පාදන බලය**

6 මැතිවරණ කොමිසමට මැතිවරණයට අදාළ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අනු නීති සම්පාදනය කිරීමේ බලය තිබිය යුතුයි එම නීති ව්‍යවස්ථාදායකයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ හැර වෙනත් කිසිදු තැනක ප්‍රශ්න නොකළ යුතුයි

**සම්පත් ලබා ගැනීම**

7 මැතිවරණ කටයුතු පහසු කර ගැනීම සඳහා ඕනෑම රාජ්‍ය ආයතනයක නිලධරයෙකු හෝ සම්පත් මැතිවරණ දෙපාර්තමේන්තුවේ ඉල්ලීමට අනුව ලබාදීමට සියළු රාජ්‍ය ආයතන වගබලා ගත යුතුයි

## නඩු පැවරීමේ බලය

8 මැතිවරණ කොමිසන් සභාවේ උපදෙස් නොසලකා හරින නිලධාරීන් හෝ ආයතන අධිකරණයට අපහාස කළා සේ සළකා කොමිසන් සභාව හෝ එමගින් බලය පවරන ආයතන මගින් නඩු පැවරිය යුතුයි

## පැමිණිලි විමර්ශනය කිරීම සඳහා විශේෂ කොමිසම

1 පැමිණිලි විමර්ශනය කිරීම සඳහා  මැතිවරණ කොමිසම යටතේ  පූර්ණ බලතල සහිත මැතිවරණ පැමිණිලි කොමිසමක් ක්‍රියාත්මක විය  යුතු අතර එකී කොමිසම මගින් ඕනෑම මැතිවරණයකදී අපේක්ෂකයෙකුගේ අපේක්ෂකත්වය  අවලංගු කිරීම දක්වා බලය සතුවිය යුත්තේයි එය ශ්‍රේෂ්ඨාධිකරණය හැර වෙනත් ස්ථානයක අභියෝගයට ලක් නොකළ යුතුයි

2 එකී කොමිසම පත් කිරීමට අවශ්‍ය මගපෙන්වීම සහ සම්පත් සපයා දීම මැතිවරණ කොමිසන් සභාවේ වගකීමක් වන්නේයි

## පොදු ස්ථාන වෙන්කිරීම

3 රැස්වීම් පැවැත්වීම සඳහා භාවිත කරන පොදු ස්ථාන වෙන් කිරීම සඳහා අදාළ ආයතනවලට මගපෙන්වීමේ කිරීමේ බලය කොමිසම සතු වන්නේයි එමෙන්ම උපදෙස් නොසළකා හරිනම් එකී භූමිය කොමිසන් සභාවේ පාලනයට ගෙන අදාළ නෙස් කිරීමේ බලය කොමිසන් සභාවේ යටතට පැවරේ

## සහනාධාර වැඩසටහන් දේශපාලනීකරණයෙන් වැළැක්වීම

4 රජයේ සංවර්ධන ව්‍යාපෘති' සහනාධාර වැඩසටහන් දේශපාලන පක්ෂය හෝ අපේක්ෂයෙක් ප්‍රවර්ධනය සඳහා භාවිත කිරීම වැළැක්වීමට කොමිසම සියළු උත්සාහයන් දැරිය යුතු අතර එම වැඩසටහන් අත්හිටුවීමට කොමිසමට බලය හිමි වන්නේයි එම වැඩසටහන් දේශපාලනිකව මෙහෙයවන නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම හෝ අදාළ ආයතන පෙළඹවීම කොමිසන් සභාවේ හිමිකමක් වන්නේයි

## දේශපාලන අයිතිය හිමි නිලධාරීන්ගේ කටයුතු පාලනය

5 දේශපාලන අයිතිය හිමි එහෙත් රාජකාරී බලය මගින් ජනතාවට දේශපාලන පෙළඹවීමක් කළහැකි මට්ටමේ රාජ්‍ය නිලධාරීන් දේශපාලන කටයුතුවල නිරත වේ නම් ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය දේශපාලන පක්ෂයක අපේක්ෂකත්වය ප්‍රවර්ධනය සඳහා භාවිතාවීම වැළැක්වීමට කොමිසම උපරිම ක්‍රියාමාර්ග ගත යුතුයි

| 17 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පරිච්ඡේදය සහ වගන්තිය | 17 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන කරුණ - සාරාංශය | යෝජිත ඌණ පූර්ණය හෝනිර්දේශ | යෝජනා හා අදහස් |
|---|---|---|---|
| 103 (1) | වෘත්තීන් හෝ පරිපාලන හෝ අධ්‍යාපන ක්ෂේත්‍රවල විශිෂ්ටතා සහිත අයගෙන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනපති පත් කරණු ලබන 5 දෙනෙක් ගෙන් සමන්විත විය යුතුයි .<br>ඔවුන් අතරින් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයෙකු ලෙස ජනාධිපතිවරයා පත්කල යුතුය. | මැතිවරණ කොමිසම් සභාවේ යෝජිත සංයුතිය - 5<br>1-නීති ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ විශ්‍රාමික නිලධාරියෙක්<br>2-විෂණන ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්<br>3-පරිපාලන ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ විශ්‍රාමික නිලධාරියෙක්<br>4,5-මැතිවරණ දෙපාර්තමේන්තුවේ අත්දැකීම් ඇති නිලධාරින් දෙදෙනෙකු<br>මින් එක් නිලධාරියෙක් නිල බලයෙන් මැතිවරණ දෙපාර්තමේන්තුවේ ජේෂ්ඨතම නිලධාරියා විය යුතුයි .<br><br>සභාපතිවරයාගේ පත් කිරීම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත පත් කළ යුතුය. | |
| 103 (2) | නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්විම මෙම කොමිසමේ පරමාර්ථය වේ. | නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම සහ ඒ සඳහා අවශ්‍යවන :<br>1- අදාල නීති කෙටුම්පත් කිරීම<br>2- නීති ප්‍රතිශෝධන ක්‍රියාවලියට දායකත්වය දීම<br>3- ඡන්ද පැමිණිලි සම්බන්ධයෙන් විභාග කර න්‍යතික කටයුතු කිරීම<br>කොමිසමෙන් ඉටු විය යුතුයි. තවද ඒ සඳහා අවශ්‍ය නීතිමය පසුබිම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිළිගත යුතුය. | |
| 103 (3) | මෙම පත් කරන සාමාජිකයන් කුමන තත්ත්වයේ හෝ දේශපාලන කටයුතුවල නිරත නොවන රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගත් අයවිය යුතුයි. | විශ්‍රාමික භාවය පිළිබඳ මෙම නිර්දේශය මැතිවරණ කොමසාරිස් ජෙනරාල්වරයාට අදාල නොවේ. | |
| 103 (4) | ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරු ධූරයෙන් ඉවත් කිරීමට අදාල (ආ.ක්‍ර.ව්‍ය) විධිවිධාන, මෙම සාමාජිකයන් ධූරයෙන් ඉවත් කිරීමට අදාල වෙනස්කම් | එම | |

| | | | |
|---|---|---|---|
| | සහිතව අදාල වේ. | | |
| **103 (5)** | කොමිසමේ අවසරයකින් තොරව අනුක්‍රක රැස්වීම් තුනකට නොපැමිණිය හොත් තුන් වන රැස්වීම් දින සිට ඔහු ධූරය අත්හැර ගියා සේ සැලකිය යුතුය. | එම | |
| **103 (6** | 3 වන ඡේදය යටතේ නුසුදුසුවීම,ජනපති වෙත යවන ලියවිල්ලක් මගින් ඉල්ලා අස්වීම, 4 වන ඡේදය යටතේ ඉවත් කිරීම,චරිත දූෂණ වරදකට වැරදිකරු වීම හෝ ප්‍රජා අශක්නුතාවන්ට යටත් කිරීමට යෝජනා සම්මත වීමක් මගින් මිස **පත් කල දින සිට වසර 5 ධූරය දැරිය යුතුය.** | ධූර කාලය - පත් කල දින සිට වසර 6 කට නොවැඩි විය යුතුයි.<br><br>කම්ටුවේ සාමාජික ධූරයක් පුරප්පාඩු වූ දින සිට සති දෙකක් ඇතුලත එම ධූරය සදහා ව්‍යවස්ථා දායක සභාව විසින් නිර්දේශ කොට ජනාධිපති විසින් සුදුසු අයෙක් පත් කළ යුතුය.<br>(කොමිෂන් සභාවේ ) | |
| **103 (7)** | ජනාධිපති විසින් සාමාජිකයෙකුට කොමිසමේ කටයුතු වලින් මාස දෙකක් නොඉක්මවන කාලයක් සඳහා නිවාඩු ලබා දිය හැකිය. එසේම මෙම කොමිසමට සුදුසුකම් ඇති අයෙක් ඒ කාලය සඳහා ව්‍යවස්ථා සභා නිර්දේශ මත පත් කල හැක | කම්ටුවේ සාමාජිකයෙකුට නිවාඩු ලබා දුන් දින සිට සතියක් ඇතුලත එම ධූරය සදහා ව්‍යවස්ථා දායක සභාව විසින් නිර්දේශ කොට ජනාධිපති විසින් සුදුසු අයෙක් තාවකාලිකව පත් කළ යුතුය. | |
| **103 (8)** | පාර්ලිමේන්තු යෝජනා සම්මතයෙන් සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලබයි. එය ඒකාබද්ධ අරමුදලට වැය බරකි. | කොමිෂන් සභාවේ සාමාජිකයන් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු වැටුප් තල හා සමාන විය යුතුය. | |
| **103 (9)** | දණ්ඩ නීති සංග්‍රහයේ 9 වන පරිච්ඡේදයට අනුව කොමිසමේ සාමාජිකයන් රාජ්‍ය සේවකයන් වේ. | | |
| **104 (1)** | කොමිෂන් සභා රැස්වීමේ ඝන පූර්ණය 3කි. | කෙටුම්පතක්, නිර්දේශයක් සම්මත කර ගැනීමේ අවස්ථාවකදී ඝණ පූර්ණය ? | |
| **104 (2) අ** | සභාපති රැස්වීම් මුලසුන දරයි, ඔහු නැතිවිට අනෙක් සාමාජිකයන්ගෙන් අයෙක් තෝරා පත් කරගනී. | | |
| **104 (2) ආ** | කොමිසමේ තීරණ බහුතර ඡන්දයෙන් ගත යුතු අතර සම ඡන්ද ලැබුනු විටක | සම ඡන්ද ලැබුනු විට පමණක් සභාපතිට ඡන්දය හිමිවේ. | |

| | | | |
|---|---|---|---|
| | සභාපතිට තීරක ඡන්දයක් හිමිවේ. | | |
| **104 (3)** | සාමාජික පුරප්පුඩු පැවතියද කොමිසම ක්‍රියාත්මක වේ. පත්කිරීම් දෝෂ පැවතියද කොමිසමේ තීරණ බලාත්මක වේ. | එම | |
| **104 අ** | 126 (1),104 උඉ,130 ව්‍යවස්ථා යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයට හා 144 යටතේ අභියාචනාධිකරණයට ඇති බලයට යටත්ව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ කොමිසම ගන්නා තීරණ, විධාන තීරණ සම්බන්ධයෙන් පැමිණිලි වෙනත් අධිකරණවලට බාර ගත නොහැක. **කොමිසමේ තීරණ, විධාන අවසාන හා තීරණාත්මකයි.** | එම | |
| **104 ආ** | කොමිසමෙ බලතල යටතේ සාමාජිකයෙකු ස්වකීය කාර්යය ඉටු කිරීමේදී සද්භාවයෙන් කරන ලද හෝ කරනු ලැබූයැයි කියන ක්‍රියාවකට නඩු පැවරිය නොහැක. | එම | |
| **104 ආ (1)** | සියලු මැතිවරණ හා ඡනමත විචාරණ පැවැත්වීම හා මැතිවරණ කොමසාරිස් වෙත පවරා ඇති බලතල හා කාර්ය කර්තව්‍ය කොමිසම විසින් ඉටු කල යුතුය. | සියළුම මැතිවරණ නිදහස්, සාධාරණ හා අපක්ෂපාතී ලෙස පැවැත්වීම සහතික කිරීම සඳහා<br>• මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා අරමුදල් රැස් කිරීම, මැතිවරණ වියදම්වලට සීමා පැනවීම, වියදම් සම්බන්ධ විගණන ලේඛණ ඉදිරිපත් කිරීම ක්‍රියා පටිපාටි නියම කිරීම සහ එම ක්‍රියා පටිපාටි උල්ලංගණය වන අවස්ථාවකදී අපේක්ෂකභාවය අවලංගු කළ හැකි නීති සම්පාදනය සහ එම නීති ක්‍රියාත්මක කිරීම මැතිවරණ කොමිසමේ වගකීමක් වන්නේය. (ඉන්දියානු මැතිරණ කොමිසමේ බලතල පිළිබඳ අධ්‍යනය කල යුතුය.)<br>• මැතිවරණ කොමිසම ඉල්ලන අවස්ථාවක දී පක්ෂ/අපේක්ෂක වියදම් වාර්තා සම්බන්ධ නිවරදි තොරතුරු මැතිවරණ කොමිසම වෙත ලබා දීමට රාජ්‍ය සහ පෞද්ගලික සියලුම | |

| | | | |
|---|---|---|---|
| | | ආයතන හා පුද්ගලයන් බැඳී සිටින බව.<br>• දේශපාලන පක්ෂ වලට අදාල වාර්ෂික විඝණන වාර්තා සහ මැතිවරණයක් අවසානයේ මැතිවරණ වියදම් සම්බන්ධයෙන් වෙනම වාර්තාවක් මැතිවරණ කොමිසමට ඉදිරිපත් කිරීම<br>• මැතිවරණ අපේක්ෂකයන් මැතිවරණයට පසු විගණන වාර්තා ලබා දීම<br>• මෙම විඝණන වාර්තා විමර්ශනය කිරීම සඳහා වෙනම විමර්ශන කණ්ඩායමක් හා අවශ්‍ය ප්‍රතිපාදන හිමි විය යුතුය.<br>• දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් සඳහා ආචාර ධර්ම පද්ධතියක් ඇති කිරීම හා එම ආචාර ධර්ම පද්ධතිය උල්ලංඝණය කල විටක මැතිවරණයකින් ජය ගත්තද අපේක්ෂකභාවය අහෝසි කිරීම දක්වා වූ දඩුවම් පරාසයකට නීති සම්පාදනය කළ යුතුය.<br>• මැතිවරණ ක්‍රියාවලියේ ඉහළම අපක්ෂපාතීත්වය සහතික කිරීම සඳහා මැතිවරණ නිරීක්ෂකයන් වශයෙන් දේශීය සංවිධාන කැඳවීම, ඡන්ද මධ්‍යස්ථාන, ගණන් කිරීමේ ස්ථාන වලට ප්‍රවේශයන් ලබා දීම. | |
| **104 (2)** | සියලු මැතිවරණ හා ජනමත විචාරණ පැවැත්වීම අදාල නීති බලාත්මක කිරීම, සුරක්ෂිත කිරීම, කොමිසමේ කාර්යභාරය වන අතර මෙම කටයුතු වලට සම්බන්ධ වන සියලු රජයේ බලධරයන් කොමිසමට සහය දැක්විය යුතුය. | සියලු රජයේ බලධරයන් කොමිසමට **<u>වගකිව</u>** යුතුය. | |
| **104 (3)** | කොමිසම පාර්ලිමේන්තුවට වගකිව යුතු හා උත්තර දිය යුතු අතර එක් එක් වර්ෂයට අදාලව වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිපත් කල යුතුය. | කොමිසමට අදාල වාර්ෂික විඝණන වාර්තාවක් විඝණකාධිපතිවරයා පාර්ලිමේන්තුවට සැපයිය යුතුය. | |
| **104 (4) (අ)(1)(11)** | මැතිවරණ කාලයකදී රජයට හෝ | කොමිසමේ සභාපති හෝ මැතිවරණ කොමසාරිස් ජෙනරාල් ගේ නියම හෝ උපදෙස් පිළිනොපදින | |

| | | | |
|---|---|---|---|
| | සංස්ථාවකට අයත් රාජ්‍ය දේපල දේශපාලන පක්ෂ, අපේක්ෂකයන් හෝ ස්වාධින කණ්ඩායම් මැතිවරණ සඳහා භාවිතය කිරීම වැනි තත්ත්ව වැලැක්වීමට කොමිසමේ සභාපති හෝ මැතිවරණ කොමසාරිස්ට බලය ඇත. - මෙම දේපළ භාරව සිටින හෝ පාලනය කරන අය මෙම නියම පිළිපැදිය යුතුය. | අවස්ථාවක එම පාර්ශවයන්ට විරුද්ධව නීතිමය ක්‍රියා මාර්ග වලින් දඩුවම් කිරීමට මැතිවරණ කොමිසමට බලය තිබිය යුතුයි.<br><br>**ඕනෑම දේපළක් තහනම් කිරීමට,කොමිසම යටතට ගැනීමට හෝ ඒ සදහා විශේෂ නිළධාරියෙක් පත් කිරීමට කොමිසමට බලය තිබිය යුතුය.** | |
| **104 (5) අ** | නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සහතික කිරීමට අවශ්‍ය බව කොමිසමට සලකනු ලබන ගුවන් විදුලි හෝ රූපවාහිනී සේවාවක් පවත්වාගෙන යන අයෙක් හෝ පුවත් පත් ප්‍රකාශකයෙකු හෝ අයිතිකරුවෙකුට කලින් කල නිවේදන නිකුත් කිරීමට බලය ඇත. | මැතිවරණයකදී රාජ්‍ය මාධ්‍ය විසින් සියලු පක්ෂ/ස්වාධීන අපේක්ෂකයන් සඳහා සමාන විකාශන කාලයක් ලබා දිය යුතුය. ඒ සඳහා නියාමනය මැතිවරණ කොමිසම විසින් සිදු කළ යුතුය. | |
| **104 (ආ)** | ඉහත නියමය යටතේ ගුවන්දුලි හා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරු එම නියමයන් සහතික කෙරෙන පරිදි කටයුතු කළ යුතුය. | ඡන්ද විමසීම් කාලය තුල රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය පිළිපැදිය යුතු උපමාන සකස් කිරීම කොමිෂන් සභාව විසින් සිදු කළ යුතුයි. තවද එකී උපමාන නියමිත ලෙස අනුගමනය කරන්නේද යන්න අධීක්ෂණයට ප්‍රතිපාදන සහ මානව සම්පත් වෙන් කළ යුතුයි | |
| **104 (ඇ)** | (අ) ඡේදය යටතේ කොමිසමේ නියමයන් රූපවාහිනී ගුවන් විදුලි සංස්ථාව උල්ලංඝණය කරන විට කොමිසම විසින් එම කාර්ය කිරීමට බලධරයෙක් පත් කරයි. ඔහු පත් කළ දින සිට මැතිවරණ අවසන් වන තෙක් මෙම සංස්ථා දෙක කළමනාකරණය කරනු ලබයි. **(මෙම බලධරයාගේ බලතල හා කාර්තව්‍ය පාර්ලිමේන්තු නීති මගින් ස්ථාපිත කළ යුතුයි)** | අවශ්‍ය විට නුසුදුසු යැයි තීරණය කරන වැඩසටහන් අත්හිටුවීමට කොමිසමට බලය තිබිය යුතුය.<br><br>විවිධ නව තාක්ෂණික ක්‍රම හරහා කරණු ලබන ප්‍රචාරණ කටයුතු හදුනා ගෙන ඒවා නියාමනය කිරීම සඳහා කොමිසම කටයුතු කළ යුතු වේ. | |
| **104 ඇ (1) (2)(4)** | සියලු මැතිවරණ හා ජනමත විචාරණ පැවැත්වීම අදාලව කොමිසමට අවශ්‍ය පහසුකම් හා පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොමිසම පොලිස්පතිවරයාට දැන්විය යුතු | සියලු මැතිවරණ හා ජනමත විචාරණ පැවැත්වෙන කාලය තුල පොලිස්පතිවරයා හා පොලීසි යමැතිවරණ කොමිසම් සභාංශ සෘජු හෝ වක්‍ර උපදෙස් පිළිපැදීමට බැඳී සිටින්නේය. මැතිරිණයෙන් අනතුරුව මාස 3 ක් යන | |

| | | | |
|---|---|---|---|
| | අතර එය පොලිස්පති ලබා දිය යුතුය. මෙම නිළධාරීන් ඡන්ද කාලය තුල කොමිසමට වග කියයි | තෙක් පොලිස් පරීක්ෂක නිලයෙන් ඉහළ නිළධාරීන් මාරු කරන්නේ නම් දඬුවමකට යටත් කරන්නේ නම් කොමිසම විමසිය යුතුය. | |
| **104 ඇ (1)** | කොමිසමේ විධාන යටතේ සිය කර්තව්‍ය ඉටු කරන පොලිස් නිළධාරීන් සද්භාවයෙන් කරන නීත්‍යානුකූල ක්‍රියා සබන්ධයෙන් නඩු පැවරි නොහැක. | එම | |
| **104 ඉ (1)** | ඡන්ද විමසීමක් හෝ ජනමතවිචාරණ පැවැත්වීමට නියම කල විට අවස්ථානෝචිතව යුධ හමුදාව යෙදවීම සඳහා ජනපතිට කොමිසම විසින් නිර්දේශ ඉදිරිපත් කිරීම නීත්‍යානුකූල වේ. | එම | |
| **104 ඉ (2)** | තමා පිළිබඳ යම් කාරණයක් කොමිසම සලකා බලන අවස්ථාවකදී හැර මැතිවරණ කොමසාරිස්වරයාට කොමිසමේ රැස්වීම් වලට පැමිණීමට හිමිකමක් ඇත. | මැතිවරණ කොමසාරිස් ජෙනරාල්වරයා කොමිසමේ අනිවාර්ය සාමාජිකයෙකු වේ. | |
| **104 ඉ (3)** | කොමිසන් සභාවේ නිර්දේශ මත කොමිසන් සභාවට වෙනත් නිළධාරීන් පත් කළ හැකිය. | එම | |
| **104 ඉ (4)** | මැතිවරණ කොමසාරිස් හා කොමිසමේ වෙනත් නිළධාරීන්ගේ වැටුප් කොමිසම තීරණය කරයි. වැටුප් ඒකාබද්ධ අරමුදලට වැය බරකි. | මැතිවරණ කොමසාරිස් ජෙනරාල්වරයා ගේ වැටුප් තලය අනෙකුත් කොමසාරිස් වරුන්ගේ වැටුප් තල වලට සමාන වේ. | |
| **104 ඉ (5)** | කොමිසමේ තීරණ මැතිවරණ කොමසාරිස්වරයා කොමිසමේ විධිවිදාන වලට හා පාලනයට යටත්ව ක්‍රියාත්මක කරන අතර කොමිසන් සභාවේ නිළධරයන් විෂයයෙහි අධීක්ෂණය කරයි. | එම | |
| **104 ඉ (6)** | කොමිසමේ බලතල,කාර්ය, කර්තව්‍ය මැතිවරණ කොමසාරිස්වරයාට හෝ කොමිසමේ වෙනත් නිළධරයකුට කොමිසමේ විධානයට හෝ බලතලවලට යටත්ව පවරා දිය හැකි වේ. | ????? | |

| | | | |
|---|---|---|---|
| **104 ඉ (7)** | මැතිවරණ කොමසාරිස් ධූරය ඔහු මියගිය විට,ඔහු විසින් කොමිසමට දන්වා යවන ලියවිල්ලකින් ඉල්ලා අස්වූ විට, අවුරුදු 65 සම්පූර්ණ වූ විට හා ශරීරික මානසික දුබලතාවය මත හෝ ඔප්පුකල විෂම පැවැත්ම පාර්ලිමේන්තු සංදේශයක් හරහා මුලු මන්ත්‍රීවරුන්ගෙන් තුනෙන් එකක් සම්මත කිරීමෙන් කොමිසම විසින් ඉවත් කරයි. | මැතිවරණ කොමසාරිස් කොමිසමේ නිල සාමාජිකයෙක් වන අතර කොමිසමෙන් ඉවත් වීම කොමිෂන් සභාවේ සියලු සාමාජිකයන් හා සමාන වේ. | |
| **104 උ** | ඡන්දවිමසීමකදී හෝ ජනමතවිචාරණයකදී කාර්ය හා කර්තව්‍ය ඉටු කරන සියලු රාජ්‍ය නිළධාරීන් කොමිසමට වගකිව යුතු හා උත්තර දිය යුතුය. | එම | |
| **104 ඌ (1)** | 140 වන ව්‍යවස්ථාව යටතේ අභියාචනාධිකරණය වෙත ඇති අධිකරණ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හෝ වෙනයම් නීත්යක් මඟින් හෝ කොමිෂන් සභාව විස්න පවරා ඇති බලතල කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කිරීමේදී උද්ගතවන යම් කාරණයකට අදාලව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලැබඅය යුත්තේය. | | |
| | | | |
| | | | |

| | | | |
|---|---|---|---|
| | | | |

**මැතිවරණ කොමිසම යටතේ මැතිවරණ දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරීත්වය**

1. මැතිවරණ කොමිසම ක්‍රියාත්මක කිරීමේදී මැතිවරණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨතම නිලධාරීයා කොමසාරිස් ජනරාල් ධුරයට පත්වන අතර ඔහු කොමිෂන් සභාවේ නිල බලයෙන් සාමාජිකයෙක් බවට පත් වේ

2. දෙපාර්තමේන්තුවේ දෛනික පරිපාලන කටයුතු කොමසාරිස් ජනරාල් වරයාගේ උපදෙස් අනුව ක්‍රියාත්මක විය යුතු තඅර ඒ සඳහා කොමිසන් සභාවේ මැදිහත් වීම අවම මට්ටමක විය යුතුයි

3. අතිරේක□ නියෝජ්‍ය□ සහකාර මැතිවරණ කොමසාරිස් වරුන්ගේ වැටුප ඒ ඒ අධිකරණ මට්ටමෙන් විනිශ්චයකාර වරුන්ගේ වැටුප් තලයට සමාන විය යුතුයි

4. මැතිවරණ දෙපාර්තමේන්තුවේ සියළුම කොමසාරිස් මට්ටමේ නිලධාරීන් කොමිසම් සභාවේ නිලධාරීන් විය යුතු අතර ඔවුන් ඉන් බැහැර වන්නේ ඔවුන් දැරූ තනතුරුවලට සමාන තනතුරු සඳහා කොමිසම් සභාවේ අවසරය මත රාජ්‍ය සේවයට ඇතුලත් විය හැකියි එහිදී ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය හෝ රාජ්‍ය සේවයේ සෙසු වරප්‍රසාද සමාන ලෙසම හිමි විය යුතුයි

5. මැතිවරණ දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය යැයි හැඟෙන මොහොතක කොමිසම් සභාවේ නිර්දේශ මත දෙපාර්තමේන්තුවට අවශ්‍ය නිලධාරීන් රාජ්‍ය සේවයේ සාමාන්‍ය පටිපාටීන්ට යටත්ව බඳවාගත යුතු වන්නේයි